# කොන්ත්‍රාත් කොන්දේසි
# T/02/2024

1. සේවායෝජකයා : සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක:615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව

2. ටෙන්ඩරයේ නම : යෝජිත නව කර්මාන්ත ජනපද ස්ථාපනය කිරිම සඳහා භූමිය සකස් කිරිම මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, වාලච්චේන

3. ලංසු පත්‍ර(Bid Form) : 2024.01.07 සිට 2024.01.29 දින ප.ව. 2.30 දක්වා නිකුත් කෙරේ.

4. ලංසු ආරක්ෂණය (Bid Bond -ආපසු ගෙවනු ලබන )
   I. ලංසු ඇපකරය ලෙස ටෙන්ඩර් කඩිනමින් 2% ක වටිකා ඇපකරයක් ඉදිරිපත් කළයුතුය.
   II. ඉහත අංක:01 හි පරිදි සේවායෝජකයාගේ ලිපිනයට ලංසු ආරක්ෂණය ඉදිරිපත් කළ යුතුය.
   III. 2024.03.29 දින දක්වා වලංගු වන පරිදි ලංසු ආරක්ෂණය ඉදිරිපත් කළ යුතුය.
   IV. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත පිළිගත හැකි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත ඉල්ලුම මත බැංකු ඇපකරයක් හෝ අදාළ මුදල ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ හෝ මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගන්නා ලද ලදු පතෙහි පිටපතක් ලංසුව සමඟ ඉදිරිපත් කළයුතුය. මුදල ප්‍රතිපූර්ණය කිරීමේදී ලදු පතෙහි පිටපත ඉදීපත් කළයුතුය.

5. කාර්ය සාධන ආරක්ෂණ (performance Security) ප්‍රමාණය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත පිළිගත හැකි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත ඉල්ලුම මත බැංකු ඇපකරයක් මාස 06 ක වලංගු කාලයක් සඳහා ලබාදිය යුතුය. එය මුළු කොන්ත්‍රාත්තවේ මිලෙන් 2% ක් වේ.

6. ලංසු ඉදිරිපත් කිරීම 2024.01.29 වන දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර සිදුකළ යුතුවේ.

7. සියළු ගෙවීම් කටයුතු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සිවිල් ඉංජිනේරු නිර්දේශ මත මැන ගෙවීමේ (Measure & pay) පදනම මත සිදුකරනු ලැබේ.

8. ටෙන්ඩර් ලබාගැනීමේ ක්‍රියාපටිපාටිය

   පිළිගත හැකි ටෙන්ඩර් ලේඛණ

   a) අදාළ ටෙන්ඩර් පත්‍රිකාව (Tender Documents ) ඊට අදාළ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර, එම ලිපිනය පහත පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ -සැපයුම් | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය |
| අංක:615, ගාලු පාර , කටුබැද්ද | නො,24, සින්නඋපපොඩයි පාර |
| මොරටුව | මඩකලපුව |
| දු.අං.011-2607004 | දු.අං. 065-2228410 |

   b) ටෙන්ඩර් ඉදිරිපත් කිරිමේ ක්‍රියාපටිපාටිය
   ලංසුකරු ලබාගන්නා ටෙන්ඩර් පත්‍රිකාව (Tender Document ) පුරවා, ඊට අදාළ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ කටුබැද්දේ පිහිටි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයේ ටෙන්ඩර් පෙට්ටියට 2024.01.29 වන දින ප.ව. 2.30 පෙර බහාලිය යුතුය.

නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැපයුම්)
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
අංක:615, ගාලු පාර,
කටුබැද්ද - මොරටුව

c) එක් ලංසුකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් ලංසුවක් පමණි.

සම්පූර්ණ කරන ලද සෑම ටෙන්ඩරයක්ම මුල් පිටපතකින් හා අනු පිටපතක් සහිතව කවරවල බහා ඉදිරිපත් කළයුතු අතර, ඒවා වෙනම ලියුම් කවරයක (හෝ දවටනයක) ඇතුළත් කර මුද්‍රා තබා ඉදිරිපත් කළයුතුය.

d) ටෙන්ඩර් විවෘත කිරීම
**ටෙන්ඩර් භාරගැනීම අවසන් වූ පසු 2024.01.29 වන දින කටුබැද්දේ පිහිටි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයෙදී ප.ව. 2.30 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩරය විවෘත කරන අවස්ථාවේ ලංසුකරු හෝ ඔහුගේ නිසි බලයලත් නියෝජිතයෙක් පැමිණ සිටිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

e) භූමිය සකස් කිරීමට අදාළ සියළුම උපකරණ හා ශ්‍රමය ටෙන්ඩර්කරු විසින් සපයාගතයුතු අතර, ඒවායේ ආරක්ෂාව ටෙන්ඩර්කරු විසින් සලසාගත යුතුවේ. ටෙන්ඩරය ලබාදී මාස දෙකක් ඇතුළත කොන්ත්‍රාත්කරු භූමිය සකස් කිරීමේ කාර්යය අවසන් කර මණ්ඩලය වෙත භාරදිය යුතුය.

f) ටෙන්ඩර්කරු මෙම කාර්යයට අදාළව සකසන යන්ත්‍ර හා උපකරණ තොරතුරු ඉදිරිපත් කළයුතු අතර, පසුගිය වසර 5 ඇතුළත ඉටුකරන ලද මෙවැනි කාර්යයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළයුතුවේ.

g) කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ අවසන් තීරණය මණ්ඩලය සතුවන අතර, ටෙන්ඩරය කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීම, කොටසක් ප්‍රදානය කිරීම අයිතය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සතුවේ.

නි/අධ්‍යක්ෂ (සැපයුම්)
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය